**සිලෝන් ෂිපින් කෝප්පරේෂන් ලිමිටඩ් සමාගම - 2016**

**--------------------------------------------------------------------------**

සිලෝන් ෂිපින් කෝප්පරේෂන් ලිමිටඩ් සමාගමේ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**--------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**කරුණු අවධාරණය කිරීම**

මාගේ මතය තත්ත්වාගණනය නොකරමින් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 13 හි සඳහන් පරිදි මෙහෙයුම් කටයුතු සිදු නොකරන, ඇවර කිරීමේ ක්‍රියාදාමයට ක්‍රියාත්මක වන සමාගමේ පරිපාලිත සමාගමක් වූ සිලෝන් ෂිපින් ඒජන්සි (පුද්.) සමාගමේ ගිණුම් ඒකාබද්ධ කිරීමේදී සැලකිල්ලට ගෙන ගිණුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබීම කෙරෙහි අවධානය යොමු කරමි.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගමේ ආදායම හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය අනුව ආදායම ඊට අදාල ඉන්වොයිසි දිනය මත හඳුනාගනු ලැබුවද නැව් නියෝජිත සේවා ආදායම හඳුනා ගැනීමේදී මුදල් ලැබෙන දිනය පදනම් කරගෙන තිබුණි. ඒ අනුව ආදායම හඳුනා ගැනීමේදී උපචිත පදනම අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

#### 2.2.2 පැහැදිළි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 05 කට අදාළව 2016 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් හා ඊට අදාල උපලේඛන සැසඳීමේදී රු. 51,779,904 ක වෙනසක් නිරීක්ෂණය විය. සමාගම විසින් භාවිතා කරනු ලබන ගිණුම්කරණ පද්ධතියේ පවත්නා දෝෂ හේතුවෙන් මෙම වෙනස්කම් ඇතිවී තිබූ බව කළමනාකරණය විසින් දක්වා තිබුණද වර්ෂ ගණනාවක සිට ගිණුම්කරණ පද්ධතියේ පැවත එන මෙම දෝෂ නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් අතර අරමුදල් හුවමාරුව සඳහා යෙදා ගන්නා 'අරමුදල් හුවමාරු ගිණුමෙහි' (Transfer of Fund Account) ශේෂය ශුන්‍ය විය යුතු නමුත් එම ගිණුමෙහි රු.3,697,466 ක ශේෂයක් වසර ගණනක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) සමාගමේ බැංකු ගිණුමකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි 2009 ජුලි මාසයේ සිට පවතින රු.519,516 ක් වූ හඳුනානොගත් තැන්පතුවක් පැවතුනු අතර මෙම වටිනාකම හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු පහත සඳහන් ගිණුම් ශේෂ ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකෙරුණු සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණය ගැතියන් (ශේෂ 10 ක්) | 824,217,759 | ශේෂ සනාථන |
| විදේශ වෙළඳ ණය හිමියන් (ශේෂ 01 ක්) | 167,734,959 | ශේෂ සනාථන |
| විදේශ ඒජන්තවරු වෙත ගෙවිය යුතු ශේෂ 05 ක් | 14,698,302 | ශේෂ සනාථන |
| අන්තර්ජාල හා දුරකථන පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 319,119 ක මාසික ස්ථාවර ගාස්තුව | 3,829,428 | සේවා සැපයුම්කරු හා සමාගම අතර ගිවිසුම |

**2.2.4 අසම්භාව්‍ය බැරකම්**

ලංකා කෝල් සමාගම විසින් මිලදී ගන්නා ලද ගල් අඟුරු මෙට්‍රික් ටොන්. 85,991 ක් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් සමාගම විසින් පුත්තලම වෙත ප්‍රවාහනය කර තිබුණු නමුත් අයහපත් කාලගුණය හේතුවෙන් නියමිත පරිදි ගොඩබෑමට නොහැකි වීම හේතුවෙන් මෙම ගල් අඟුරු තොගය නැවත සැපයීමේ පදනම මත ඉන්දියානු සමාගමක් වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් සමාගම් අතර ඇතිකරගත් ගිවිසුම් අනුව වාර 5 ක් තුල ගල් අඟුරු තොගය නැවත සැපයීමට එකඟ වී තිබුණු අතර 2012 නොවැම්බර් 10 දින වනවිට තවදුරටත් සැපයිය යුතුව පැවති ගල් අඟුරු මෙට්‍රික් ටොන් 29,896 ක ප්‍රමිතිය සම්බන්ධයෙන් නොඑකඟතාවයක් ඇතිවී තිබුණි. ඒ හේතුවෙන් ගල් අඟුරු තොගය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සැපයිය නොහැකිව තිබුණු අතර මෙම ගල් අඟුරු තොගය අදාල සැපයුම්කරු මඟින් සපයා දීම සම්බන්ධයෙන් සමාගම වෙත පැනනැගී තිබුණු අසම්භාව්‍ය බැරකම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.69,544 ක් වූ බැර ශේෂ 03 ක් හා එකතුව රු. 4,354,402 ක් වූ හර ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) 2016 මාර්තු 31 දිනට පැවති වෙළඳ ණයගැති ශේෂය රු. මිලියන 1,191.27 ක් වූ අතර එයින් සියයට 31ක් හෙවත් රු.මිලියන 366.6 ක් වර්ෂ 04 වැඩි කාලයක සිට හිඟහිට ඉදිරියට ගෙන

එමින් පැවතුනි. මෙම ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව සම්පූර්ණ වටිනාකම සඳහා හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි.

(ඇ) සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වැඩිපුර ප්‍රේෂණය කර තිබූ රු.මිලියන 21.54 ක්වූ භාණ්ඩ හා සේවා බදු සහ ජාතික ආරක්ෂක බදු ව්‍යවස්ථාපිත අයවීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. වසර 16කට ආසන්න කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවත්නා එම මුදල් අයකර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) | (2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් හා තොග සම්බන්ධයෙන් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමීක්ෂණ සිදුකර නොතිබුණි. විගණන සෝදිසි පරීක්ෂාවලදී අස්ථාන ගතවූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා නියමිත පරිදි කේත ගත නොකල වත්කම් පැවති අවස්ථා නිරීක්ෂණය විය. |
| (ii) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 8.3.4 වගන්තිය හා 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 2/2015 දරන චක්‍රලේඛය. | චක්‍රලේඛය ප්‍රකාරව සියළු සන්නිවේදන බිල්පත් සඳහා උපරිම සීමාවන් නිර්ණය කර ඇතත්, සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් නියමිත සීමාව ඉක්මවා රු.514,228 ක බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර එම වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන චක්‍රලේඛය. | චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව ඒ ඒ නිලධාරී කාණ්ඩයන් සඳහාවූ නිශ්චිත මාසික ඉන්ධන සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 11 දෙනෙකුට රු.598,806 ක් වූ ඉන්ධන හෝ ඉන්ධන දීමනා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ලබාදී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | කළමනාකරණ සේවා චක්‍රලේඛය<br>-----------------------<br>2015 දෙසැම්බර් 09 දිනැති අංක 2/2015 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ දක්වා ඇති ආයතන වර්ගීකරණය අනුව සිය පාලක මණ්ඩල වල අනුමැතිය මත 2015 වර්ෂය තුළ එක් සේවකයෙකුට ගෙවිය යුතු වාර්ෂික ප්‍රසාද දීමනා මුදල රු.13,500 ක් වුවත් සමාගම විසින් සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ අවස්ථා දෙකකදී එක් අයෙකුට රු.48,500 ක් බැගින් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව රු.35,000 ක් බැගින් වැඩිපුර ප්‍රසාද දීමනා සේවකයන්ට ගෙවා තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර සමාගමේ සභාපතිවරයාට හා විධායක අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු මාසික දීමනාව පිළිවෙළින් රු. 60,000 ක් හා රු.45,000 ක් වූ අතර 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් එම දීමනාව 2015 ජුලි 01 දින සිට පිළිවෙළින් රු. 80,000 ක් හා රු.65,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 වර්ෂයේදී ගනු ලැබූ තීරණයක් ප්‍රකාරව සභාපතිවරයාට හා විධායක අධ්‍යක්ෂවරයාට පිළිවෙළින් රු.85,000 ක් හා රු.75,000 ක් බැගින් මාසික දීමනා ගෙවා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.300,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ඉහත (අ) හි දැක්වෙන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව චක්‍රලේඛයෙහි දැක්වෙන දීමනා හැරුණු කොට වෙනත් කිසිදු දීමනාවක් සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නොගෙවිය යුතු බව දක්වා ඇතත් ඊට පටහැනිව පූර්ව වර්ෂයකදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් ප්‍රකාරව සමාගම විසින් සභාපතිවරයා වෙත හා විධායක අධ්‍යක්ෂවරයා වෙත පිළිවෙළින් රු.100,000ක හා රු.50,000ක මාසික උපරිමයකට යටත්ව ණය පත්‍ර දීමනාවක් (Credit Card Allowance) අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී එම ණය පත්‍ර වෙනුවෙන් සමාගම විසින් රු. 882,321 ක් වැයකර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.74,317,129 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 124,942,025 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.50,624,896 කින් හෙවත් සියයට 40.5ක පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ සෘජු මෙහෙයුම් වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.126,094,264 කින් හෙවත් සියයට 93කින් වැඩිවීම හා ශුද්ධ විනිමය අලාභය රු.23,309,445 ක් වීම සහ වෙනත් ආදායම රු.46,524,605 කින් හෙවත් සියයට 126.8 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011/2012 ගිණුම් වර්ෂයේ සිට 2013/2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2013/2014 වර්ෂයට සාපේක්ෂව

ඉකුත් වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය සියයට 50 කින්ද සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය සියයට 70 කින්ද පිරිහී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමේදී 2011/2012 ගිණුම් වර්ෂයේදී රු.මිලියන 242 ක්වූ දායකත්වය 2015/2016 ගිණුම් වර්ෂයේදී රු. මිලියන 375.6 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමේ ගල් අඟුරු මෙහෙයුම් ආදායම (Agency & Address Commission) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 47 කින් හෙවත් රු. 208,829,325 කින් පිරිහී තිබුණි. මේ සඳහා ලංකා කෝල් සමාගම විසින් ගෙවනු ලබන ගල් අඟුරු මෙට්‍රික් ටොන්එකකට වූ කොමිස් මුදල ඇ.ඩො. 15 ක සිට ඇ. ඩො. 11.5 දක්වා අඩුවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

(ආ) ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමේ සෘජු වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 93 ක් හෙවත් රු. 126,094,264 කින් වර්ධනයවී තිබුණි. සමාගම විසින් මිලදීගනු ලැබූ සිලෝන් බ්‍රීස් නෞකාවේ ඉන්ධන, කාර්ය මණ්ඩල වියදම් ඇතුළු මෙහෙයුම් වියදම් සඳහා රු.මිලියන 83.7 ක වියදමක් දැරීම මෙයට හේතුවී තිබුණි.

(ඇ) අනුපාත විශ්ලේෂණය

-----------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ප්‍රමාණාත්මක අනුපාත හා ප්‍රතිශතයන් පහත දැක්වේ.

| | **2015/16** | **2014/15** |
|---|---|---|
| දළ ලාභ අනුපාතය (සියයට) | 58 | 78 |
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 12 | 20 |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභය (සියයට) | 1 | 3 |
| ණය එකතු කිරීමේ කාලය -දින | 705 | 684 |
| ණය බේරුම් කිරීමේ කාලය -දින | 1001 | 1922 |
| ජංගම අනුපාතය | 1.07:1 | 2.08:1 |
| ක්ෂණික ප්‍රාග්ධන අනුපාතය | 1.02:1 | 2.08:1 |
| දිගුකාලීන ප්‍රාග්ධනීකරණ අනුපාතය | 0.80 | 0.69 |
| ස්කන්ධ ප්‍රාග්ධනයට ණය අනුපාතය | 6.31 | 3.66 |

(i) **දල ලාභ අනුපාතය පිරිහීම**

-----------------------------

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දල ලාභ අනුපාතිකය සියයට 26 කින් පහල ගොස් තිබුණු අතර, ආදායම් අඩුවීම හා සෘජු වියදමේ සියයට 93 ක වැඩිවීම මෙයට බලපා තිබුණි.

(ii) යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය පිරිහීම

-----------------------------------------------------

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය සියයට 3 සිට සියයට 1 දක්වා අඩුවී පැවති අතර , නෞකා මිලදී ගැනීම සඳහා මහජන බැංකුවෙන් ලබාගෙන තිබූ රු.මිලියන 8,219 ක ණය මුදල මෙම පිරිහීමට බලපා තිබුණි.

(iii) ණය එකතු කිරීමේ කාලය

-------------------------------

සමාලෝචිත වර්ෂයේ සමාගමේ ණය ගැති පිරිවැටුම් කාලය දින 705 ක් වූ අතර පසුගිය වර්ෂයේ දින 684 ක් විය. ණය ගැතියන් සම්බන්ධව විධිමත් පාලන පිළිවෙතක් අනුගමනය කර නොතිබීම ණය ගැති පිරිවැටුම් කාලය දීර්ඝවීම කෙරේ බලපා තිබුණු අතර විශාල වශයෙන් බොල්ණය හෝ අඩමාන ණය ප්‍රතිපාදන සිදුකර සමාලෝචිත වර්ෂය තුල ණයගැතියන්ගේ සියයට 31 ක්ද , පූර්ව වර්ෂයේ ණය ගැතියන්ගෙන් සියයට 27 ක් ද අපහායන වෙන් කිරීම් සිදුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

#### 4.1.1 සමාගමේ මූලික අරමුණු

----------------------------

ලංකා නැව් සංස්ථාවේ සාංගමික සංස්ථාපත්‍රය අනුව සමාගමේ මූලික අරමුණු සංක්ෂිප්තව පහත දැක්වේ.

(i) නෞකා හිමියකු, මගී හා බඩු නෞකා මෙහෙයුම්කරුවකු, තැරැව්කරුවකු, ඒජන්තවරයකු, කළමනාකරුවකු, උපදේශකයකු, රක්ෂණ හා පොදු තැරැව්කරුවකු, ප්‍රවාහකයකු හා නැව් බඩු නිෂ්කාශන හා ප්‍රේෂණකරුවකු ලෙස දේශීයව හා අන්තර්ජාතිකව ව්‍යාපාර කටයුතු කිරීම.

(ii) නෞකා හා මාර්ග ප්‍රවාහන සේවා ඇති කිරීම, නඩත්තුව හා පවත්වාගෙන යාම.

(iii) නෞකා හෝ වෙනත් යාත්‍රා හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍ය මිලදී ගැනීම, විකිණීම, කුලියට ගැනීම, ගොඩ නැගීම හෝ අත්පත් කර ගැනීම සහ ගැඹුරු මුහුදේ හෝ ගංගාවල, ඇලමාර්ග හෝ කලපු ආශ්‍රිතව වියළි තොග, දැව හා වායුමය ද්‍රව්‍ය ප්‍රවාහනය.

(iv) බහුවිධ ප්‍රවාහන ක්‍රම මිලට ගැනීම, විකිණීම, කුලියට ගැනීම, බදු ගැනීම,ඉදිකිරීම හෝ අත්පත් කර ගැනීම හා භාණ්ඩ ප්‍රවාහනයේ යෙදවීම.

(v) සංචාරක නියෝජිතයකු සහ කොන්ත්‍රාත්කරුවකු ලෙස ව්‍යාපාර කිරීම, ප්‍රවාහන පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය කිරීම.

(vi) නෞකා හා වෙනත් බහුවිධ ප්‍රවාහන කටයුතු සම්බන්ධ ව්‍යාපාරවල ඒජන්තවරයකු ලෙස, කළමනාකරණ ඒජන්තයකු ලෙස, තැරැව්කරුවකු ලෙස ක්‍රියාකිරීම.

(vii) නෞකා පන්තියක් පිහිටුවීම හා මෙහෙය වීම හෝ යාත්‍රා කිරීම හෝ වෙනත් බහුවිධ ප්‍රවාහන මාධ්‍යයන් ඇතිකිරීමට බලපත්‍ර හෝ එකඟතාවයන් ලබා ගැනීම.

(viii) මගීන්ට හා සංචාරකයින්ට ජලාශ්‍රීත විනෝදාස්වාද පහසුකම් සැලසීම හා ඒ ආශ්‍රිත සේවා සැපයීම පිළිබඳ ව්‍යාපාර කටයුතු.

විගණනයේදී නිරීක්ෂණය වූ අන්දමට සමාගමේ මූලික අරමුණුවලින් ඇතැම් අරමුණු ඉටුකර ගැනීම කෙරේ අවධානය යොමු කර නොතිබුණු අතර 2015 හා 2016 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම් අනුව අඩු අවධානයක් යොමුකර තිබුණු අරමුණු සංක්ෂිප්තව පහත දැක්වේ.

(i) බහුවිධ ප්‍රවාහන ක්‍රම මිලට ගැනීම, විකිණීම, කුලියට ගැනීම, බදු ගැනීම,ඉදිකිරීම හෝ වෙනත් ක්‍රමයකට අත්පත් කර ගැනීම හා ඕනෑම වර්ගයක භාණ්ඩ ප්‍රවාහනයේ යෙදවීම.

(ii) සංචාරක නියෝජිතයකු සහ කොන්ත්‍රාත්කරුවකු ලෙස ව්‍යාපාර කිරීම, සංචාරකයින්ට හෝ මගීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම හා ඒ පිළිබඳ ප්‍රවර්ධනය කිරීම.

(iii) මගීන්ට හා සංචාරකයින්ට ජලාශ්‍රිත විනෝදාස්වාද පහසුකම් සැලසීම හා ඒ ආශ්‍රිත සේවා සැපයීම පිළිබඳ ව්‍යාපාර කටයුතු.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සමාගම විසින් ආපසු අයකර ගැනීමට කටයුතු නොකළ වර්ෂ 05 සිට වර්ෂ 38 දක්වා වූ රු. 5,000 සිට රු. 500,000 ක් දක්වා පරාසයක පැවති එකතුව රු. 2,276,287 ක් වූ ආරක්ෂිත තැන්පතු හා අත්තිකාරම් ශේෂ 22 ක් පැවතුනි. මෙම ශේෂ වර්ෂය තුළදීද අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර, හානිකරණ වෙන් කිරීම්ද සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකල අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (i) මූල්‍ය පාලනය | (i) හඳුනා නොගත් බැංකු තැන්පතු පැවතීම<br>(ii) වලංගු කාලය ඉක්ම වූ චෙක්පත් පැවතීම<br>(iii)සුළු මුදල් පාලන දුර්වලතා පැවතීම |
| (ii) වාහන පාලනය | (I)ලොග් සටහන් පොත් විධිමත්ව නොපැවැත්වීම<br>(II)ඉන්ධන නිකුත් කිරීම් ලේඛන ගත කිරීම පිළිබඳ විධිමත් අධීක්ෂණයක් නොවීම |
| (iii) තාක්ෂණික තොරතුරු පද්ධති | (I)තොරතුරු පද්ධතියේ නඩත්තු හා පාලනයන් සිදු නොකිරීම,<br>(II) සමාගමේ අවශ්‍යතාවන්ට නොගැලපීම |
| (iv) ණය හිමි හා ණය ගැති පාලනය | අයකර ගැනීම් හා ගෙවීම් ප්‍රමාදයන් පැවතීම |